# ආර්ථික වශයෙන් ක්‍රියාකාරි /ක්‍රියාකාරි නොවන වැඩිහිටි ජනගහනය පිළිබඳ විමසුමක්





මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව

පි.ඩබ්.චතුරිකා චන්ද්‍රසේන

## 01.හැඳින්වීම

ජනගහනය වයස්ගත වීම සමස්ත ලෝක ප්‍රජාවම හමුවේ වන ගැටළුවකි.ජපානය හා යුරෝපා රටවල් වර්තමානයේ අත්විඳින ජනගහනය වයස්ගත වීමේ රටාවට ආසන්න වෙමින් පවතී.දියුණු වෙමින් පවත්නා ශ්‍රී ලංකාව වැනි රටක මෙලෙස ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් වයස අවුරුදු 60ට වඩා වැඩි වයස් කාණ්ඩවල වීම රටක් ලෙස විශාල අභියෝගයක් වේ.ඒ අනුව වැඩිහිටි ජනගහනයේ ශීඝ්‍රයෙන් වර්ධනය වන රට ලෙස ශ්‍රී ලංකාව හඳුනා ගෙන ඇත.

බොහෝ රටවල් වැඩිහිටි ජනගහනය කොටස් දෙකකට වෙන් කර ඇත.ඒ අනුව **වයස අවුරුදු 60-74 දක්වා තරුණ වැඩිහිටි ලෙසද, වයස අවුරුදු 75 සහ ඊට වැඩි ජනගහනය මහලු වැඩිහිටි** ලෙස ද හැඳින්වේ.දත්ත අනුව **වැඩිහිටි ජනගහනයෙන් 78% ක් අයත් වන්නේ ආර්ථිකයට කිසියම් ඵලදායී දායකත්වයක් ලබා දීමේ හැකියාව පවතින තරුණ වැඩිහිටි (අවු 60-74) කාණ්ඩ වේ.ඉතිරි 22% අවු 74 ට වඩා වැඩි වයස්ගත පුද්ගලයන් වෙති.**ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුද්ගලයින් ජීවත්වන ස්ථාන අනුවද ප්‍රධාන කොටස් දෙකකට වෙන් කළ හැක.එනම් ගෘහ කාණ්ඩවල ජීවත් වන පුද්ගලයින් හා වෙනත් වැඩිහිටි නිවාස වැනි ආයතනවල ජීවත් වන පුද්ගලයින් ලෙසය.වැඩිහිටියන්ගෙන් **99%ක්ම ගෘහ කාණ්ඩවල ජීවත් වන බව ජන හා නිවාස සංගණනයෙන්** වාර්තා වන අතර **වැඩිහිටි පුද්ගලයින්ගෙන් 25% ක් පමණ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වන බවද එම දත්ත වලින් හෙළි වේ.**

සංගණන තොරතුරු අනුව ගණනය කළ පරිදි ශ්‍රී ලංකාවේ සමස්ථ යැපුම් අනුපාතය 60 වූ අතර මහළු යැපුම් අනුපාතය 19.8 කි.මින් අදහස් වන්නේ ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් සිය දෙනෙකු විසින් යැපෙන්නන් 60 දෙනකු රැක බලා ගන්නා බවයි.එම යැපෙන්නන් 60 අතර වැඩිහිටි යැපෙන්නන් 30 ක් සිටියි. 1981 ජන සංගණන දත්ත අනුව එක් වයස්ගත පුද්ගලයකුගේ රැකවරණය සැලසීම සඳහා ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් 9ක් සිටි බව පැහැදිලි වේ.එහෙත් 2012 දී එක් වයස්ගත පුද්ගලයකුගේ රැකවරණය සැලසීම සඳහා වන ශ්‍රම බලකායට අයත් පුද්ගලයින් සංඛ්‍යාව 5 දක්වා අඩු වී ඇත.එනම් **ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ශ්‍රම බලකායට පෝෂණය කළ යුතු වැඩිහිටි යැපෙන්නන් සංඛ්‍යාව ගත වූ වසර 31 තුළ වැඩි වී ඇත.***1[1]

**2030 වර්ෂය වන විට මෙම වැඩිහිටි ප්‍රතිශතය 36% දක්වා ඉහළ යා හැකි බව සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය පෙන්වා දෙයි.**

මිහිතලය මත ජීවත් වන මිනිස් සංඛ්‍යාව අතුරින් සෑම අට දෙනෙකුගෙන් එක් අයෙක් වයස 65 ඉක්ම වූවෙක් වනු ඇත.ඇමරිකාව,එංගලන්තය වැනි බටහිර රටවල වැඩිහිටියන්ගෙන් 95%ක පමණ ජීවත් වන්නේ වැඩිහිටි නිවාස වලය.පවුල්වලට බරක් වී ඇති එම වැඩිහිටි පරපුර ලංකාව ,ඉන්දියාව,කාම්බෝජය වැනි සමාජයට සම්පතක් වී ඇත.

[1] ශ්‍රී ලංකාවේ ඉහල යන වැඩිහිටි ජනගහනය-ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය-ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

වයස අවුරුදු15ට අඩු හා වයස අවුරුදු 64 ඉක්මවා ගිය අය ඵලදායිතාවට දායක නොවන බව සැලකේ.රාජ්‍ය ප්‍රතිපත්ති හා සමාජ ආකල්ප වෙනස් විය යුතු බව හෙල්පේජ් පැසිෆික් කලාපීය සංවිධානය අවධාරණය කරයි.එම ආයතනයේ කලාපීය අධ්‍යක්ෂ එඩුවාඩෝ ක්ලයින් මහතා පවසන්නේ වයසට යාම තමන්ට හා අන් අයට බරක් යැයි සිතන ගතානුගතික ආකල්පය ඉවත දමා එය සම්පතක් හා නව අවස්ථා රැසක් විවර වීමක් ලෙස සිතීමට රජය,පෞද්ගලික අංශය,රාජ්‍ය නොවන ක්ෂේත්‍රය හා සංවර්ධන ආයතන ආරම්භ කළ යුතු බවයි.

## 02.දකුණු ආසියාවේ වියපත් ජනගහනය

**වියපත් ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය (වයස - අවු 60+)**

1975 - 2025

| රට | 1975 | 2000 | 2025 |
|---|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | 4.7 | 4.7 | 5.2 |
| බංග්ලාදේශය | 5.5 | 4.9 | 8.4 |
| භූතානය | 6.5 | 6.5 | 7.0 |
| ඉන්දියාව | 7.0 | 7.6 | 12.5 |
| මාලදිවයින | 5.3 | 5.3 | 6.2 |
| නේපාලය | 5.9 | 5.9 | 7.1 |
| පකිස්ථානය | 5.8 | 5.8 | 7.3 |
| **ලංකාව** | **9.3** | **9.3** | **18** |

මූලය : ජනගහන අධ්‍යයනය (ශ්‍රී ලංකාව ඇසුරින් 2004)

**වියපත් ජනසංඛ්‍යාවේ ප්‍රතිශතය (වයස අවු 60+) 1975 - 2025**වසර **2000** වන විට දකුණු ආසියාවේ වැඩිම **වියපත් වූවන්ගේ ප්‍රතිශතයක්** වාර්තා කර ඇත්තේ ශ්‍රී ලංකාවයි.එම අගය **9.3%** කි.2025 වන විටද දකුණු ආසියාවේ වියපත්වීමට තදින්ම ලක්වන රට වන්නේ ශ්‍රී ලංකාවයි.ශ්‍රී ලංකාවට පසුව වේගවත් වියපත්වීමක් සිදුවන්නේ ඉන්දියාවේය**.**

**ශ්‍රී ලංකාවේ ජනගහනයේ වර්ධනය හා වයස් සංයුතිය (1946 - 2004)**

| වසර | මුළු ජනගහනය(දහස්) | වයස අවුරුදු 60 වැඩි ජනගහනය(දහස්) | අවු 60ට වැඩි වයස්ගත වුවන්ගේ ප්‍රතිශතය | මුළු ජනගහනයේ වාර්ෂික වර්ධන අනුපාතය | අවු 60 ට වැඩි වයස්ගතවුවන්ගේ වාර්ෂික වර්ධන අනුපාතය |
|---|---|---|---|---|---|
| 1946 | 6657 | 360 | 5.4 | | |
| 1953 | 8098 | 437 | 5.4 | 2.8 | 2.81 |
| 1963 | 10582 | 621 | 5.9 | 2.63 | 3.41 |
| 1971 | 12690 | 807 | 6.3 | 2.22 | 3.20 |
| 1981 | 14847 | 986 | 6.6 | 1.67 | 2.0 |
| 1991 | 17015 | 1393 | 8.1 | 1.36 | 3.45 |
| 2001 | 19186 | 1916 | 9.9 | 1.20 | 3.10 |
| 2011 | 21114 | 2765 | 13.1 | 0.96 | 3.67 |
| 2021 | 22375 | 3997 | 17.8 | 0.58 | 3.69 |
| 2031 | 22778 | 5103 | 22.4 | 0.18 | 3.44 |
| 2041 | 22697 | 6305 | 27.8 | -0.03 | 2.12 |

මුලාශ්‍ර-ආර්ථික විමසුම-1999

1946 දී ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ජන සංඛ්‍යාව මුළු ජන සංඛ්‍යාවෙන් 5.4ක් විය.2001 දී එම අගය 9.9 දක්වා වර්ධනය විය.එසේම 1981-2011 කාල පරිච්ඡේදය තුළ වියපත් ජනගහනය දෙගුණයක් වී ඇත.එසේම **2041** වන විට ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් **27.8%** ක් වයස අවුරුදු **60** හෝ ඊට වැඩි ජන සංඛ්‍යාව වන බව පුරෝකථනය කර ඇත.

**ලෝකයේ වියපත් ජනගහනය(වියපත් ජනගහනය සහ ළමා ජනගහනය මුළු ජනගහන ප්‍රතිශතයක් ලෙස 1950-2050)**







**වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ජනගහනය -**

(ද සිල්වා, ඉන්ද්‍රලාල්, ජනගහන අධ්‍යයනය ( ලංකාව ඇසුරින්ශ්‍රී), 2004,)

## 03.වියපත්වීම තුළ සමාජ ආර්ථික ගැටලු

සංවර්ධිත රටවල ජනගහනය වියපත්වීම සිදුවූයේ සමාජ ආර්ථික දියුණුවත් සමගිනි.මේ නිසා එම රටවලට වියපත්වීම සම්බන්ධ අභියෝගයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය වැඩසටහන්,සැලසුම් සකස් කිරීමට ප්‍රමාණවත් කාලයක් මෙන්ම ශක්‍යතාවක්ද පැවතිනි.නමුත් සංවර්ධනය වෙමින් පවතින රටවල වියපත්වීම සිදුවන්නේ සමාජ ආර්ථික දියුණුවකින් තොරවය.එසේම කෙටිකාලයක් තුළ ජනගහනය වියපත්වීම සිදුවේ.මේ නිසා වියපත්වීම සංවර්ධනය වෙමින් පවතින රටවලට විවිධ සමාජ ආර්ථික ගැටලු ඇති කරයි. රටක වියපත් ජනගහනයක් පවතින විට ඔවුන්ව රැක බලාගැනීමට සිදුවේ.වියපත් වූවන් රැක බලා ගැනීම පවුල් සංස්ථාවේ මෙන්ම රජයේද වගකීමකි.මේ නිසා පවුල් සංස්ථාවේ යැපෙන්නන් ප්‍රමාණය වැඩිවේ.එසේම රජයට වියපත්වූවන් වෙනුවෙන් උපකාරක සේවා සැපයීමට සිදුවේ.විශේෂයෙන්ම වියපත්වූවන්ට වැළඳෙන රෝග අංශභාගය, දියවැඩියාව, වැනි නිධන්ගත රෝගයි.මේනිසා ඔවුන්ට දීර්ඝකාලීනව නේවාසික ප්‍රතිකාර කිරීමට අවශ්‍ය සෞඛ්‍ය සේවා සැපයීමට රජයට සිදුවේ.වියපත් ජනගහනය වැඩිවන විට රජයට විශ්‍රාම වැටුප් සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ.විශ්‍රාම වැටුප් සංක්‍රාම වියදමකි.මේ නිසා සම්පත් ඵලදායී ආර්ථික කටයුත්තක යෙදවීමෙන් නිමැවුමක් ලබා ගැනීමට ඇති හැකියාව නැති වේ.*2[23]

## 04.වැඩිහිටි ජනගහනය වයස් කාණ්ඩ අනුව ආර්ථික කටයුතුවල නියැලීම.

| වයස් කාණ්ඩය | ආර්ථික කටයුතු වල යෙදෙන වැඩිහිටියන් | | සේවකයින් | | සේවා යෝජකයන් | | තමාගේම ආර්ථික කටයුතු වල නියැලෙන්නන් | | වැටුප් නොලබන ආර්ථික කටයුතුවල නියැලෙන්නන් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % | ගණන | % |
| එකතුව | 636,779 | 100 | 218,883 | 34.4 | 21,125 | 3.3 | 351,935 | 55.3 | 44,836 | 7.0 |
| 60-64 | 342,674 | 100 | 123,489 | 36.0 | 10,565 | 3.1 | 185,229 | 54.1 | 23,391 | 6.8 |
| 65-69 | 170,425 | 100 | 55,879 | 32.8 | 5,572 | 3.3 | 96,908 | 56.9 | 12,066 | 7.1 |
| 70-74 | 73,395 | 100 | 20,791 | 28.3 | 2,733 | 3.7 | 44,232 | 60.3 | 5,639 | 7.7 |
| 75-79 | 29,574 | 100 | 7,798 | 26.4 | 1,420 | 4.8 | 17,882 | 60.5 | 2,474 | 8.4 |
| 80ට වැඩි | 20,711 | 100 | 10,926 | 52.8 | 835 | 4.0 | 7,684 | 37.1 | 1,266 | 6.1 |
| | | | | | | | | | | |

2

.ඉන්ද්‍ර ලාල් ද සිල්වා-ජනගහන අධ්‍යයනය-2004




3

( ශ්‍රී ලංකාවේ ඉහල යන වැඩිහිටි ජනගහනය-ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය-ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව 2012)

**සංගණන තොරතුරු වලට අනුව වයස අවු 60ට වැඩි පුද්ගලයින්ගෙන් 25.6%ක් ආර්ථික දායකත්වයක් ලබා දෙන අතර ඔවුන්ගෙන් අඩක්ම (55%)තමාගේම ආර්ථික කටයුතුවල නියැලෙන්නන් වීම සැලකිය යුතු කරුණකි.**

වෙළෙන්දන්, කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන්නන් වැනි තමන්ගේම ව්‍යාපාර පවත්වාගෙන යන අය මෙම කාණ්ඩයට අයත් වන අතර වයස්ගත විමේදී මෙම පුද්ගලයින්ට විශ්‍රාම වැටුපක් හෝ කිසියම් ආදායමක් නොමැත.**වයස අවු .60 වැඩි පුද්ගලයින් යෙදි සිටින ආර්ථික කටයුතු පිළිබඳ විස්තර දැක්වේ.ආර්ථික කටයුතුවල නිරත වන වැඩිහිටියන්ගෙන් 2%ක් රාජ්‍ය අංශයේද ,1%ක් අර්ධ රාජ්‍ය අංශයේද 32%ක් පුද්ගලික අංශයේද වැටුප් ලබන සේවකයෝ වෙති.**

## 05.මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුව-ස්ත්‍රී/පුරුෂ භාවය අනුව-2016-2018

| වයස් කාණ්ඩය | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී |
| **65-69** | **659** | **295** | **364** | **666** | **298** | **368** | **672** | **301** | **371** |
| 70-74 | 429 | 189 | 240 | 433 | 191 | 242 | 438 | 193 | 245 |
| 75-79 | 295 | 121 | 174 | 298 | 123 | 175 | 301 | 124 | 177 |
| 80+ | 285 | 113 | 172 | 287 | 113 | 174 | 290 | 115 | 175 |

(ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව 2016/2017/2018)

2016/2017/2018 වර්ෂයන්හි ස්ත්‍රී/පුරුෂ භාවය අනුව මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුව දැක්වේ.වර්ෂ 3 හි වැඩිහිටි ජනගහනය සංසන්දනය කර බැලිමේදී,**2018 වර්ෂයේහි 65-69 වයස් කාණ්ඩයේ වැඩි අගයක්**

**දක්නට ලැබේ.එය 672 කි.අවු.70-74 වයස් කාණ්ඩයද එම වර්ෂයේ ඉහළ අගයක් ගනී.එය 438 කී.අවු.75-79 වයස් කාණ්ඩද එම වර්ෂයේ වැඩි අගයක් ගනී.අවු.80+වයස් කාණ්ඩයද 2018 වර්ෂයේ ඉහළ අගයක් ගනී.ඒ අනුව 2018 වර්ෂයේ සෑම වයස් කාණ්ඩයකම වැඩි වීමක් සිදු වී ඇත.**

මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුව-ස්ත්‍රී/පුරුෂ භාවය අනුව-2016-2018






වයස් කාණ්ඩ අනුව ජනගහනයේ ප්‍රතිශතාත්මක ව්‍යාප්තිය(1971-2041)




සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ගෙන් එකක් ලෙස ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යුහය නුදුරු අනාගතයේදී ඉහළ වැඩිහිටි ජන සනත්වයක් කරා ශීඝ්‍රයෙන් පරිවර්තනය වනු ඇතැයි අපේක්ෂිතය.ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය 2021 වසර වන විට මුළු ජනගහනයෙන් සියයට 16.7ක් දක්වා ඉහළ යන බවට සහ 2041 වසර වන විට එය සියයට 24.8 දක්වා තව දුරටත් වැඩි වන බවට පුරෝකතනය කර ඇත.මී ළඟ දශක දෙක ඇතුළත දළ වශයෙන් සෑම පුද්ගලයින් හතර දෙනෙකුගෙන් එක් අයෙකු වයස අවුරුදු 60 හෝ ඉට වැඩිවනු ඇති බව මෙමගින් පෙන්නුම් කෙරේ.4

45

---

4

4 මහ බැංකු වාර්තා -2018

## 06.අදහස් හා යෝජනා

I. ශ්‍රී ලාංකික වැඩිහිටි ජනගහනය සංඛ්‍යාත්මකව ඉහළ යාමෙන් රටෙහි ශ්‍රම බලකායට අනාගතයේදී වන පීඩනය අවම කිරිම සඳහා මේ වන විට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක විම ආරම්භ විය යුතුය.මෙහිදි වැඩිහිටි සුරක්ෂිතභාවය පිළිබඳව ආකල්පමය වර්ධනයක් සිදු විය යුතු අතර වැඩිහිටියන් රැක බලා ගැනිම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

II. වයස අවුරුදු 60 ට වඩා වැඩි වයස් කාණ්ඩ වලට අයත් ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඵලදායී ශ්‍රම දායකත්වයක් ආර්ථිකයට ලබා දේ.ඔවුන්ගේ පරිණත බව හා දැනුම රටේ ආර්ථිකයේ දියුණුවට ඵලදායී ලෙස ලබා ගැනිමට සැලසුම් සකස් විය යුතුය.

III. අබාධිත ප්‍රජා පුනරුත්තාපන වැඩසටහනට සමරූපිව වැඩිහිටි ප්‍රජා සහන සේවයක් ලංකාවට උචිතය.එමගින් වැඩිහිටියන් තම පවුලේ සමාජිකයන් අතරේම රඳවාගෙන උපස්ථාන කළ හැකිය.

IV. රාජ්‍ය සේවයේ යෙදි සිටි විශ්‍රාම ලත් රාජ්‍ය සේවක බහුතරයක් රටට ඵලදායී මෙහෙවරක් ලබා ගැනිමේ ඉඩකඩ ඇත.විශ්‍රාම ගිය ඔවුන්ගේ දැනිම,අත්දැකිම්,පළපුරුද්ද,ශිල්පීය දක්ෂතාව හා විවිධ නිපුණතා සමාජ යහපතට උකහා ගැනිම සඳහා වැඩිහිටි පුහුණු මිනිස් සංචිතයක් පිහිටුවා එමඟින් සමාජ,ආර්ථික,ජනසන්නිවේදන,දේශපාලන හා නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගත හැකිය.මෙය ඇමරිකාව,ස්විට්සර්ලන්තය, කැනඩාව වැනි දියුණු රටවල ක්‍රියාත්මක වේ.

V. වැඩිහිටි ජනගහනය විශ්‍රාම ගිය පසු ඔවුන් නැවත රැකියා ගත කිරිමට පවතින බාධාවන් හඳුනා ගැනිම හා ඒ සඳහා විසඳුම් සෙවිම.

VI. දැනුම,කුසලතා හා පලපුරුද්ද අනුව කුසලතා සංසදයක් නිර්මාණය කිරිම.

VII. මෙවන් පසුබිමක් තුළ වයස්ගත ජනගහනය වැඩිවීමේ සමාජ හා ආර්ථික අභියෝගවලට මුහුණ දෙමින්, මේ තත්ත්වය අනාගතයේදී ආර්ථිකයට බරක් නොවන පරිදි සහ ආර්ථික වර්ධනයට උපකාරී වන අයුරින් යොදා ගැනීමට අවශ්‍ය නිසි පූර්ව ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍යය. මෙහිදී වයස්ගත ජනගහනය, වඩා වැඩි කාලයක් ශ්‍රම බලකායේ රඳවා ගැනීමට අනුබල දෙන ආකාරයෙන් වැඩ කරන වසර ගණන වැඩි කිරීම සඳහා සුදුසු වන අයුරින් විශ්‍රාමික ප්‍රතිලාභයන් වෙනස් කිරීම, වෙනස් වන ආර්ථිකයට අනුගත වන ලෙස මානව සම්පතෙහි කුසලතාවන් අඛණ්ඩව වර්ධනය කර ගැනීමට කටයුතු යෙදීම, වයස් අනුව සිදුවන වෙනස්ව සැලකීම් අවම කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හා සංස්කෘතික වෙනස්කම් සැලසීම ආදී සුදුසු ප්‍රතිපත්තීන් යොදාගත යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙයි.

VIII. රාජ්‍ය අංශයේ සේවකයන්ට ඔවුන්ගේ දායකත්වයෙන් තොරවම රජයේ විශ්‍රාම වැටුපක් හිමිය. ඒ නිසා ඔවුන්ගේ විශ්‍රාම දිවියට සුරක්ෂිතභාවයක් ඇත. එහෙත් රටක වැඩ කරන ජනතාවගෙන් අතිමහත් බහුතරය පෞද්ගලික අංශයේ සේවකයන්ය. ඔවුන්ගෙන් බොහෝ දෙනකුට විශ්‍රාම වැටුපක් නැත. එසේ වුවත් පෞද්ගලික සේවකයන්ගෙන් විධිමත් අංශයේ සේවකයන්ට ඔවුන්ගේ දායකත්වයෙන් ලබාදෙන සේවක අර්ථසාධක අරමුදලක් මගින් ප්‍රතිලාභි හිමි වේ.

එසේම සේවක භාරකාර අරමුදල හා පාරිතෝෂික ගෙවීම් මගින්ද ඔවුන්ට යම් රැකවරණයක් ඇත. එහෙත් ප්‍රශ්නය තිබෙන්නේ අවිධිමත් අංශයේ සේවකයන් සම්බන්ධයෙන් හා වැටුප් නොලබන හා නිවෙස්වල හා පවුලේ වැඩකටයුතුවල නිරත වන අය සම්බන්ධයෙනි. එවැනි සැලකිය යුතු පිරිසක් වෙනුවෙන් සමාජ ආරක්‍ෂණ ක්‍රමවේදයක් නොමැතිවීම විශාල අර්බුදයකි.

IX. මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 12.4 කින් සමන්විත වන වයස අවුරුදු 60 සහ ඉහළ වයස් කාණ්ඩයට අයත් ජනගහනය ,අනෙකුත් දකුණු ආසියාතික රටවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.එසේම මෙම අගය සංවර්ධනය වෙමින් පවතින රටක් සඳහා ඉහළ අගයකි.වයස්ගත යැපුම් අනුපාත වැඩිවීම සහ සමාජ සුභසාධන හා සෞඛ්‍ය සඳහා රජයේ වියදම් වැඩිවීම යන ආකාරවලින් වයස්ගත ජනගහන සංසිද්ධිය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය කෙරෙහි අභියෝගාත්මක බලපෑම් එල්ල කරනු ලබයි.එබැවින් ජනගහනය ආර්ථික කටයුතුවල දිගු කාලයක් නිරත කරවීම සඳහා ක්‍රමික විශ්‍රාම ගැන්වීම ,විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව ඉහළ දැමීම සහ කුසලතා වැඩි දියුණු කිරීම යනාදියට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතුය.

**වැඩිහිටියන්ගේ සමාජ සුභ සාධන අවශ්‍යතා**

වයස්ගත ජනගහනයේ සමාජ සුභසාධන සඳහා රජය විසින් දැනටමත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.වැඩිහිටියන්ගේ ඉදිරි ජීවිත රැකවරණය උදෙසා පහත දැක්වෙන අංශ තවදුරටත් පුළුල් කිරීම සුදුසු වනු ඇත.

i. සමස්ථ වැඩිහිටි ප්‍රජාව සඳහා මෙන්ම වැඩිහිටි කාන්තාවන්ට ප්‍රමුඛතාව හිමි වන පරිදි වැඩිහිටියන් සුරැකීමේ මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා රාජ්‍ය,රාජ්‍ය නොවන අංශ හා පෞද්ගලික අංශය දිරිගැන්වීම.

ii. වැඩිහිටියන් අතර කිසියම් ආර්ථික කටයුත්තක නියැලීමේ හැකියාව ඇති හෝ කැමැත්ත ඇති පුද්ගලයින් සිටිය හැකිය..මෙවැනි පුද්ගලයින් සඳහා සුදුසු ආර්ථික කටයුතු හඳුන්වා දිය යුතු අතර කිසියම් නිෂ්පාදන කටයුත්තක නියැලෙන වැඩිහිටියන්ගේ නිෂ්පාදන අලෙවිය සඳහාද සුදුසු ක්‍රියා මාර්ග ආරම්භ කිරීම.

iii. පෞද්ගලික අංශයේ හා අවිධිමත් අංශයේ නියුතු සියළු සේවකයන් සඳහා සුදුසු විශ්‍රාම ක්‍රමයක් ස්ථාපිත කිරීම.

iv. මෙරට කාන්තාවන් බහුතරයක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරි නොවන බැවින් වයස්ගත වීමේදී වැඩිහිටි කාන්තාවන් ස්වාමියා හා දරුවන් යැපෙන්නන් බවට පත්වන බව දත්ත අනුව පැහැදිලි වේ.එබැවින් තරුණ වයස් ඛාණ්ඩ

වලදී කාන්තාවන් ආර්ථිකයට දායක වීම ඉහළ නැංවීම මෙන්ම මෙම තත්ත්වය පිළිබඳ සමාජය දැනුවත් කිරීම.

v. ආර්ථික වශයෙන් ක්‍රියාකාරි වන කාන්තාවන්ටද මුදල් ඉතුරුම් ක්‍රම මෙන්ම රක්ෂණාවරන ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීම.

vi. වැඩිහිටියන් අතුරින් බහුතරයකගේ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා සහන මිලට ඖෂධ සැපයීම අවශ්‍ය වේ.එමෙන්ම වෛද්‍ය පරික්ෂණ හෝ වැඩිහිටියන් සඳහා වන සෞඛ්‍ය විශේෂ සෞඛ්‍ය මධ්‍යස්ථාන ඇති කිරීම.

vii. වැඩිහිටියනේග් එදිනෙදා ජීවිතය නිදහස් පරිසරයක් තුළ සතුටින් ගත කිරීමට ආගමික සිද්ධස්ථාන ආශ්‍රිතව නිවාඩු නිකේතන ඇති කිරීමට රාජ්‍ය හා පෞද්ගලික අංශය දිරි ගැන්වීම.

viii. වයස්ගත හා අබාධිත පුද්ගලයින් පොදු මාර්ග ප්‍රවාහන මාධ්‍යයන් භාවිතයේදී විවිධ ගැටළු ඇතිවේ.වයස්ගත පුද්ගලයින්ගේ ගමනාගමන කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයන් ඉදිරියේදි සැලසුම් කිරීම.

ix. වර්තමාන ජීව දත්ත අනුව පුරුෂයන්ගේ ආයු කාලය අඩුවීමේ ප්‍රවනතා දැකිය හැක.මෙහි ප්‍රතිඵලයක් ලෙස වැඩිහිටි ජනගහනය අතර බහුතරයක් කාන්තාවන් වැන්දඹු වේ.එබැවින් වයස්ගත වීමට පෙර පුරුෂයින්ගේ යහපත් සෞඛ්‍ය තත්ත්වය නංවාලීම සඳහා සුදුසු වැඩසටහන් ආරම්භ කිරීම.

x. විශේෂයෙන් වැටුප් ලබන ස්ථිර සේවකයින් සඳහා අදාළ ආයතන විසින් අවු.50 හෝ ඊට ආසන්න වයස් කාණ්ඩවලදී වෛද්‍ය පරික්ෂාවන් සිදු කිරීම අනිවාර්ය කිරීම හා රෝගී තත්ත්වයන් සහිත පුද්ගලයින්ට අදාල ප්‍රතිකාර ලබා ගැනීම සඳහා යොමු කිරීම.

xi. අනෙකුත් ස්ථිර නොවන සේවකයින් සඳහාද වයස්ගත වීමට ප්‍රථම එනම් අවු.50 හෝ ඊට ආසන්න වයස් කාණ්ඩවලදී අවශ්‍ය වෛද්‍ය පරික්ෂාවන්ට යොමු කිරීම සඳහා රජය මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- ආර්ථික විමසුම-1999
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා(1 වෙළුම) -2018-ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලය
- ශ්‍රී ලංකාවේ ඉහල යන වැඩිහිටි ජනගහනය-ජන සංගණන හා ප්‍රජා විද්‍යා අංශය-ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව
- ඉන්ද්‍ර ලාල් ද සිල්වා-ජනගහන අධ්‍යයනය-2004